2021 දෙසැම්බර් මාසයට අදාළව මාර්ගගත ක්‍රමයට ලද, රාජ්‍ය ආදායමට බැරකළ යුතු (20-03-02-99) රු.5,384,958 ක මුදල හා විභාග ගාස්තු වශයෙන් එකතු කරන ලද (20-03-02-13) රු.1,726,310 ක මුදල 2022 වර්ෂයේ ආදායම් වශයෙන්	වර්ෂයට අදාළ අදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.	එකඟ වී නිබුණි.

1

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ලද ආදායම් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) **ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 වර්ෂයේදී ඉවත ලන කඩදාසි කිලෝ ග්‍රෑම් 1 ක් රු.6 බැගින් කිලෝ ග්‍රෑම් 359,010 ක ප්‍රමාණයක් හා 2022 වර්ෂයේදී කිලෝ ග්‍රෑම් එකක් රු.9.918 ක් බැගින් කිලෝ ග්‍රෑම් 188,980 ක ප්‍රමාණයක් වාලිචෙනෙයි කඩදාසි කම්හල වෙත ලබා දී තිබුණද ඒ වෙනුවෙන් ලැබිය යුතු රු.4,028,360 ක මුදල් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	නියමිත පරිදි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වී තිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	වැඩ කහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2022.12.31 දිනට අයවිය යුතු වසර 05 ඉක්ම වූ රු.140,567 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ.	එකඟ වී තිබුණි.
(ii)	සේවය හැර ගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් රු.221,144 ක මුදලක් දෙපාර්තමේන්තුවට අය වීමට ඇති අතර, මෙම මුදල අවුරුදු 2 ත් අවුරුදු 5 ත් අතර කාල පරාසයක සිට අයවිය යුතුව පැවතුණි.	අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ.	එකඟ වී තිබුණි.

(iii)	අඩුරුදු 1 - 2 අතර ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.333,121 ක මුදලක් එම ආයතන වෙතින් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ.	එකඟ වී තිබුණි.
(iv)	සමාලෝචිත වර්ෂය තුළ දී විශ්‍රාම ගිය නිලධාරිණියකට අදාළව අයවිය යුතු රු.125,994 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.	අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ.	එකඟ වී තිබුණි.

(ඇ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	2022 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ ACA 4 ආකෘතිය අනුව තැන්පතු ලැබීම් රු.41,657,596 ක් වී තිබූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව තැන්පතු ලැබීම් රු.53,371,354 ක් වූයෙන් ACA 4 ආකෘතියේ තැන්පත් ලැබීම් රු.11,713,758 ක් අඩුවෙන් දක්වා තිබුණි.	තැන්පත් ගිණුම් නිවැරදිව සකස් කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.	එකඟ වී තිබුණි.
(ii)	ACA 4 ආකෘතියේ තැන්පතු ගෙවීම් රු.85,749,001 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහයට අනුව තැන්පතු ගෙවීම් රු.97,462,759 කි. මේ අනුව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ACA 4 ආකෘතියේ තැන්පතු ගෙවීම් රු.11,713,758 ක ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.	තැන්පත් ගිණුම් නිවැරදිව සකස් කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමග සැසඳීම් කළ යුතු බව.	එකඟ වී තිබුණි.

(ඉ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති බත්තරමුල්ල පිහිටි හෙක්ටයාර 1.356 ක ඉඩම 2022 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොමැති වුවද රු.630,000,000 ක වටිනාකමකට එය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.	ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වී තිබුණි.
(ii)	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2020 ජූනි මාසයේ හා 2021 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට පවරා දෙනු ලැබූ පිළිවෙලින් ඇඹිලිපිටිය පල්ලේගම පරණ කඳවුර අංක 20 දරන ස්ථානයේ පිහිටි හෙක්ටයාර 0.0960 ක ඉඩම සහ කොත්මලේ කොට්ඨාශයට අයත් රිවර්සයිඩ් වතු බංගලාව සහ තවත් ගොඩනැගිලි ඇතුළත් හෙක්ටයාර් 0.328 ක ඉඩම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.	ඉඩම තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කළ යුතුය.	එකඟ වී තිබුණි.

(ඊ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	ඇප ලේඛනය		
	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම.	පිළිගෙන ඇත.

(ii) භානි පිළිබඳ ලේඛනය

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව භානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව භානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම.	වාහන සඳහා පමණක් භානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ඇත.

(iii) බැරකම් පිළිබඳ ලේඛනය

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම.	එකඟ වී ඇත.

(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය		නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම		
	රු.			
(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
මුදල් රෙගුලාසි 751	-	රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කල යුතු වුවද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විභාග දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද ටැබ් පරිගණක 223, Charging rack 03, Pouch 1,465 , Ear Phone 1,465 ක් හා Virus Guard 1,465 ක් තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.	එකඟ වී තිබුණි.

(ii)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛය		සියළුම වාහන මාස 12 කට වරක් හෝ කි.මී.25000 ක ධාවනයකින් පසු ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදු කර නොතිබුණි.	චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය.
(iii)	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ			
	2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය	214,685,262	සියළුම බැරකම් එම මුදල් වර්ෂය තුළදීම නිරවුල් කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.	චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය.

			එකඟ වී නිබුණ.
			එකඟ වී නිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

බැරකම් හා බැදීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුව සතු පැරණි විභාග ප්‍රතිඵල ලේඛන ස්කෑන් කිරීම සඳහා 2021 වර්ෂයේ පුද්ගලික ආයතනයක් සමග බැඳීමක් ඇති කරගෙන ඇති අතර අදාළ ආයතනය විසින් 2021 නොවැම්බර් 03 දින ස්කෑන් කිරීමේ නියැදියක් අවසන්කර දෙපාර්තමේන්තුවට භාරදී ඇතත් දෙපාර්තමේන්තුව විසින් එහි නිවැරදිභාවය පරීක්ෂා කර එම ආයතනය සමග විධිමත් ගිවිසුමකට ඇතුළත් වීමට කටයුතු නොකිරීම හේතුවෙන්, රු.14,205,500 ක මුදල බැඳීම් ලෙස තවදුරටත් දක්වා නිබුණි.	නියමිත කාර්යය කාල පරිච්ඡේදයකින් තොරව ඉටුකර බැඳීම් වලින් නිදහස් විය යුතුය.	එකඟ වී නිබුණි.
(ආ)	දෙපාර්තමේන්තුවේ සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.7,591,878 ක මුදල බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.	සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.	එකඟ වී නිබුණි.

	(ඇ) නිල නිවාස 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.1,735,046 ක මුදල බැරකම් ලෙස සඳහන් කර නොතිබුණි.	සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.	එකඟ වී නිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර ඊට අනුරූපව ප්‍රසම්පාදන සැලසුම්ද සකස් කර නොතිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	එකඟ වී නිබුණි.

3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2011 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් මතු වූ ගැටළු විමර්ශන කිරීම සඳහා පත් කරන ලද විද්වත් කමිටු යෝජනාවකට අනුව 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර 2019 පෙබරවාරි 02 අවසන් කිරීමට නියමිත සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල රු.564,320,835 ක කොන්ත්‍රාත් මුදලකට ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී ඇතත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. මෙම ඉදිකිරීම් වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශයට රු.64,858,719 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.304,671,983 ක් ද වශයෙන් රු.369,530,702 ක මුදලක් ගෙවීම් කර තිබුණි.	ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමාදයට හේතුව සොයා තවදුරටත් ඉදිකිරීම් ප්‍රමාදය වලක්වාගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ගත යුතු වේ.	එකඟ වී නිබුණි.

3.3 මුදල් නිදහස් කර නිබුණත් ප්‍රගතියක් ලබා නොනිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
නිල නිවාස 03 ක් මිලදීගැනීම වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවල රු.32,965,888 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද 2022 දෙසැම්බර් 31 දින වනවිටත් විභාග දෙපාර්තමේන්තුවට එම නිල නිවාස වල හිමිකාරිත්වය ලැබී නොතිබුණි.	නිල නිවාස පවරාගැනීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කර පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු බව.	එකඟ වී තිබුණි.

3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.	එකඟ වී තිබුණි.

3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩුබාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ වියදමට අදාළ වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු	මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.	එකඟ වී තිබුණි.

	අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ උක්ත වගකීම් දරන කිසිදු නිලධාරියෙකු ඇප තැබීමක් සිදුකර නොතිබුණි.		
(ආ)	2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 වගන්තිය අනුව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වෙනි අධිකාරියේ 4 වගන්තියට අනුව රජයේ නිලධාරීන් විසින් ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට කළ හැකි බව දක්වා තිබුණද දෙපාර්තමේන්තුව තුළ මෙතෙක් එවැනි තීරණයක් ගෙන නොතිබුණි.	චක්‍රලේඛ උපදෙස්වලට අනුව කළමනාකරණය විසින් තීරණය ගත යුතුව ඇත.	එකඟ වී නිබුණි.

3.6 අනාවරණය වූ විගණන නිරීක්ෂණ

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සඳහන් කරන්න.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	විභාග දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ පවත්වන ලද විභාග සඳහා දෙපාර්තමේන්තුව සතු මුද්‍රණ යන්ත්‍ර 10 ක් භාවිතා කරමින් ප්‍රශ්න පත්‍ර 19,571,852 ක් මුද්‍රණය කර තිබුණි. 2018 වර්ෂයේදී රු.546,264,452 ක වියදමක් දරමින් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා මිලදී ගනු ලැබූ වෙබ් ඕෆ්සට් ප්‍රින්ටින් යන්ත්‍රය උපයෝගී කරගෙන 2022 වර්ෂයේදී ප්‍රශ්න පත්‍ර 690,125 ක් පමණක් මුද්‍රණය කර තිබූ අතර එම ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ සමස්ථ ප්‍රශ්න පත්‍ර මුද්‍රණ ප්‍රමාණයෙන් සියයට 3.5 කි.	වත්කම් මිලදී ගැනීමේදී දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය හඳුනාගත යුතු අතර වත්කම් මිලදීගැනීමෙන් පසු අපේක්ෂා කරන ලද ධාරිතාවය ලබාගැනීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය.	එකඟ වී නිබුණි.
(ආ)	2005 වර්ෂයේදී මිලදී ගනු ලැබූ Slitch Master Gathering and wire Stiching machine අංක 32(001279) දරන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදී කොළ ඉවතට හැලීම හේතුවෙන් මිලදීගත් මුල් අවස්ථාවේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයෙන් ඉවත් කර ඇත.	යන්ත්‍රය මිලදී ගැනීමේ දී අපේක්ෂා කරන ලද ඉලක්කය ලගාකර ගැනීමට සුදුසුද යන්න පරීක්ෂා කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවේ වගකීමක් විය යුතුය.	එකඟ වී නිබුණි.

(ඇ)	ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා රු.8,428,637ක් වටිනා වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස 2018 වර්ෂයේ මිලදීගෙන තිබුණ ද කිසිදු ප්‍රයෝජනයක් නොගෙන මිලදී ගත් දින සිට නිශ්කාර්යව තිබුණි.	තාක්ෂණික ඇගයීම් කමිටුව නිවැරදි තීරණ ගත යුතුය.	එකඟ වී තිබුණි.

3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2023 මැයි 3D දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

විගණන විමසුම් පිළිබඳ විස්තරය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කළ සූර්ය බලශක්ති පද්ධතියේ කාර්යසාධනය **EDU/B/DE/2021/AQ/05**	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයිය යුතුය.	මේ සම්බන්ධයෙන් කමිටුවක් පත්කර නිර්දේශ ලබාගැනීමට කටයුතු කර ඇත.

3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ආයතනික විභාග පැවැත්වීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 09 කින් රු.38,203,407 ක් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව පැවති අතර එකී ආයතන වෙතින් වියදම් අයකරගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සහිත උපදෙස් ලබාදෙන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබුණද, ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර ලැබී නොතිබුණි.	ලිඛිත උපදෙස් භාණ්ඩාගාරය වෙතින් ලබාගත යුතු වේ.	එකඟ වී තිබුණි.
(ආ)	ආයතන විභාග පවත්වා ගාස්තු අයකළ යුතු බව ප්‍රකාශ කර සිටියද සම්පූර්ණ මුදලම හෝ අත්තිකාරමක් නොගෙන විභාග 09 ක ප්‍රතිඵල නිකුත් කර තිබුණි. 2021 වර්ෂයේ පැවැත්වූ විභාග 06 ක ද 2022 වර්ෂයේ දෙසැම්බර් දක්වා පැවැත්වූ විභාග 04 කද මෙසේ අත්තිකාරම් මුදලක් හෝ නොගෙන ප්‍රතිඵල නිකුත් කර තිබුණි.	සියලු රාජ්‍ය ආයතන සඳහා සමාන ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර මුදල් ලබාගැනීමේ මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	එකඟ වී තිබුණි.

(ඇ)	අළුත් ගාස්තු පොතෙහි ඡේද අංක 01 ට අනුව රහස්‍ය ලේඛන කටයුතු වල යෙදීම වෙනුවෙන් ගෙවනු ලබන මාසික රහස්‍ය දීමනාව වසරකට උපරිම මාස 06 කට සීමාකර ගෙවිය යුතු වුවද, මාසික රහස්‍ය දීමනාව මාස 12 කට අදාලව රු.628,456 ක් නිලධාරීන්ගේ මාසික වැටුපට එකතු කර ගෙවා තිබුණු නමුත් වැඩිපුර ගෙවන ලද මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වී තිබුණි.
(ඈ)	රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පුද්ගලික ආයතනවලට බදවාගන්නා නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සහ සේවයේ උසස්කිරීම් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අ.පොස. (සා.පෙළ) සහ අ.පොස. (උසස් පෙළ) විභාගයන්හි ප්‍රතිඵල සනාථ කරගැනීම අවශ්‍ය වේ. එහෙත් 2022 දෙසැම්බර් 31 දිනට විභාග දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිඵල සනාථ කිරීම් සඳහා ලැබුණු ඉල්ලීම් ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳව තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබූ හෙයින් ප්‍රතිඵල සනාථ කිරීමේ ප්‍රගතිය විගණනයේ දී පරීක්ෂා කළ නොහැකි විය.	විභාග ප්‍රතිඵල සනාථ කිරීමේ ක්‍රමවේදය විධිමත්ව සිදු විය යුතුය.	එකඟ වී තිබුණි.
(ඉ)	විභාග සහතික පත්‍රවල නාම සංශෝධනය කළ යුතු බවට ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බලා එම නාම සංශෝධනයන් සිදු කළ අවස්ථාවේදීම එම සංශෝධනය වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නාම සංශෝධනය කළ අවස්ථාවේම වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ඉක්මනින් ගත යුතුය.	එකඟ වී තිබුණි.
(ඊ)	2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැයකර කිලෝ වොට් 250 ක සූර්ය බලශක්ති පද්ධතියක් විභාග දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කර තිබුණ ද මෙම පද්ධතියේ නිෂ්පාදන ධාරිතාවය සහ පරිභෝජනය පිළිබඳව පවතින අපැහැදිලිතාවය ඉවත් කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙන නොතිබුණි.	නිෂ්පාදන ධාරිතාව හා පරිභෝජනය නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	එකඟ වී තිබුණි.
(උ)	සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය කළ දින සිට වසර හතක කාලයක් අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සැපයිය යුතු බවත් රඳවාගත් මුදල් 10% නිදහස් කිරීමට පෙර	සේවා සැපයුම් සඳහා වූ ගිවිසුම් අත්සන් කළ යුතු අතර නඩත්තු ආයතන සමග සාකච්ඡා කර සේවා කටයුතු ඉතා ඉක්මනින්	කමිටුවක් පත්කර නිර්දේශ ලබාගැනීමට කටයුතු කරමින් පවතී.

	සැපයුම්කරු විසින් නඩත්තු සේවා සැපයීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළ යුතු බවත් ලංසු ලියවිලිවල දක්වා තිබුණ ද විභාග දෙපාර්තමේන්තුව විසින් 2018 ජූලි 12 දින වනවිට මෙම ව්‍යාපෘතියට අදාළ සියලුම මුදල් ගෙවා අවසන් කර තිබුණු අතර මේ වන තෙක් සේවා සපයන ආයතනය සමඟ නඩත්තු කටයුතු සම්බන්ධව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. තවද ඉදිකෙරෙමින් පවතින ගොඩනැගිල්ලෙහි ඉහළ මාලයේ වහලෙහි සවිකර තිබුණු සෝලා පැනල් 20 ක් දිගු කාලයක සිට ගලවා ඉවත්කර තිබුණි.	සිදු කර ධාරිතාවය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත යුතු වේ.	
(ඌ)	AS400 පරිගණක පද්ධතිය IBM Power 6 සිට IBM Power 9 දක්වා වැඩිදියුණු කිරීමේදී Power 6 පද්ධතිය සඳහා භාවිතා කර තිබූ බලපත්‍ර (License) සහ මෘදුකාංග නව IBM Power 9 පද්ධතිය සඳහාද භාවිතා කර ඇත. එම බලපත්‍ර මෘදුකාංග භාවිතය හේතුවෙන් ඉතිරි වූ මුදල පිළිබඳ ගණනය කිරීමෙන් තොරව සම්පූර්ණ මුදලම ගෙවීම් සිදුකර තිබුණි. තවද පැරණි යන්ත්‍රය 2023 මැයි 15 දක්වා අපහරණය කර නොතිබූ අතර මිලදීගැනීමේදී සිදු කළ යුතු පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි.	තාක්ෂණික උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කළ යුතු බව.	තාක්ෂණික උපදෙස් ලබාගනිමින් පවතී.
(එ)	2022 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය 2022 දෙසැම්බර් මස 18 දින පවත්වා අවසන් කර එම විභාගයේ ප්‍රතිඵල 2023 ජනවාරි මස 25 දින නිකුත් කර තිබුණි. අයදුම්කරුවන් 334,698 ප්‍රමාණයක් සහභාගී වන ලද මෙම විභාගයේ ප්‍රතිඵල, විභාගය පවත්වා දින 37 කින් නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. එම විභාගයේ ප්‍රතිඵල, නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් 25,157 කගේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල විගණිත දින දක්වා, එනම් 2023 මැයි 16 දින වන විටත් නිකුත් කිරීමට අවශ්‍ය පියවර දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.	නැවත සමීක්ෂණ ප්‍රතිඵල අපේක්ෂකයන්ට අසාධාරණයක් නොවන පරිදි කඩිනමින් නිකුත් කළ යුතු බව.	පිළිතුරු ලබා දී නැත.
(ඒ)	2021 වර්ෂයේ අ.පොස. (සා.පෙළ) විභාගය 2022 වර්ෂයේ ජූනි මස 01 දින වන විට පවත්වා අවසන් කර තිබූ අතර, එම	නැවත සමීක්ෂණ ප්‍රතිඵල අපේක්ෂකයන්ට අසාධාරණයක් නොවන පරිදි	පිළිතුරු ලබා දී නැත.

	විභාගයේ ප්‍රතිඵල 2022 වර්ෂයේ නොවැම්බර් මස 25 දින නිකුත් කර තිබුණි. විභාගය පවත්වා මාස 06 කට පසු ප්‍රතිඵල නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ අතර විභාගයේ ප්‍රතිඵල නිකුත් කර මාස 06 ක් ගත වී තිබුණද නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට අවශ්‍ය පියවර 2023 මැයි මස 18 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.	කඩිනමින් නිකුත් කළ යුතු බව.	
(ඇ)	අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුවේ නව ඩිජිටල්කරණ වැඩසටහන සඳහා ටැබ් පරිගණක 1,500 ක් ලබා දී තිබුණද ඉන් ටැබ් පරිගණක 800 ක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලබාදී තිබුණි. ඉතිරි ටැබ් පරිගණක 700 න් 210 ක ප්‍රමාණයක් හා ගුවන් හමුදාව වෙත ලබාදුන් ටැබ් පරිගණක 800 න් නැවත දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ටැබ් පරිගණක 250 ක ප්‍රමාණයක් 2023 මැයි 23 දින වන විටත් පාසල් විභාග ඇගයීම් ශාඛාවේ උනන උපයෝජිතව පැවතුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි.	දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා වත්කම් ලබාගැනීමේදී අවශ්‍යතාවය සලකා බලා වත්කම් ලබාගැනීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තුව වෙත ලබාගත් වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතු බව.	එක් අදියරයක් සඳහා මණ්ඩල 900 - 1,100 ක් ක්‍රියාත්මක වේ. ගුවන් හමුදාව වෙත ටැබ් පරිගණක 800 ක් ලබාදීම හේතුවෙන් වැඩසටහන සඳහා ටැබ් පරිගණක ප්‍රමාණවත් නොවේ.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 15 ක්, තෘතීයික මට්ටමේ නිලධාරීන් 12 ක්, ද්විතීයික මට්ටමේ නිලධාරීන් 173 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 18 ක් ලෙස දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු 218 ක් පවතින බව නිරීක්ෂණය විය.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.	එකඟ වී නිබුණි.

T.R.M.V

ටී.ආර්.එම්. විරරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
ජාතික මට්ටමේ පාසල් විභාග සංවිධානය හා පැවැත්වීම {5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ)}	100%			
ආයතනික විභාග පැවැත්වීම				37%
සහතිකපත්‍ර නිකුත් කිරීම	90%			
නව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම	90%			

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG Goal 4 ගුණාත්මක අධ්‍යාපනය	5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පොස. (උ.පෙළ), අ.පොස. (සා.පෙළ) සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය යන විභාග පොදු කාලසටහනක් යටතේ දිවයින පුරා එකම වේලාවක පැවැත්වීම සහ ඒ සඳහා සියලු අපේක්ෂකයන්ට සමාන ප්‍රවේශ අවස්ථා ලබාදීම	එම විභාග සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව			✓
	විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ ආබාධ සහ දුර්වලතා සම්මුඛ පරීක්ෂණයක් මගින් හඳුනාගෙන ඔවුන්ට විභාගයට පෙනී සිටීමේ දී සහන ලබා දීම උදා :- 1. ඔවුන් භාවිතා කරන හුරුපුරුදු උපකරණ, විශේෂ රෝද පුටු, විභාග කාර්යමණ්ඩලය අවශ්‍යතාව අනුව යොදවා ගැනීමට ඉඩ දීම 2. වැඩිපුර කාලය ලබාදීම 3. විශේෂිත විභාග පරිපාලන ක්‍රම	සහන ලබාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව			✓
	ගැහැණු හෝ පිරිමි, ආගම් අනුව, සංස්කෘතීන් අනුව ප්‍රශ්න පත්‍රයක අයිතම නැඹුරු වීම අවම කිරීම	ප්‍රශ්න පත්‍රවල සෑමට සාධාරණභාවය			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG Goal 4 ගුණාත්මක අධ්‍යාපනය	දත්ත විශ්ලේෂණ මගින් විභාග අපේක්ෂකයන් දුර්වලතා දක්වන ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සහ ගුරු උපදේශකවරුන් / විෂය නිලධාරීන්ට තම කොට්ඨාසවල විෂය සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීමට උපකාර කිරීම	සෑම ජාතික විභාගයකම ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු දත්ත විශ්ලේෂණය කොට වාර්තා වෙබ් අඩවියෙහි පළ කිරීම			✓
	අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවල තෝරාගත් විෂයයන් සඳහා ශිෂ්‍ය සාධන දත්ත සහ සාර්ථකව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු ඇතුළත් ඇගයීම් වාර්තා දිවයිනේ අදාළ පාසල් සඳහා ලබාදීමෙන් සියලු සිසුන්ට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම	අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවල ප්‍රධාන විෂයන්වලට අදාළව නිමවන ලද ඇගයීම් වාර්තා		✓	
	ප්‍රශ්න පත්‍රවල අයිතම විශ්ලේෂණය සහ සිසුන්ගේ සාධනය පිළිබඳ තොරතුරු ඇතුළත් සියලුම විෂයන්ගේ සමපාලක පරීක්ෂකවරුන් සඳහා ලබාදෙන පොත් හරහා විභාග අපේක්ෂක සැමට සාධාරණ ප්‍රශ්න පත්‍රයක් ලබාදීමට පහසුකම් සැලසීම	සෑම විෂයකම තොරතුරු ඇතුළත් CCM පොත්			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

- 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2021 (2022), අ.පොෂ. (උ.පෙළ) 2021 (2022), අ.පොෂ. (සා.පෙළ) 2021 (2022) සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2022 යන විභාග රහස්‍යභාවය උපරිම ආරක්ෂා කරමින්, පොදු කාලසටහනක් යටතේ දිවයින පුරා එකම වේලාවක පැවැත්වූ අතර ඒ සඳහා සියලු අපේක්ෂකයන්ට සමාන ප්‍රවේශ අවස්ථා ලබා දෙන ලදී.

- 2021 වර්ෂයේ දී පැවැත්වූ සියලුම ජාතික මට්ටමේ විභාග පැවැත්වීමට පෙර විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ ආබාධ සහ දුර්වලතා සම්මුඛ පරීක්ෂණයක් මගින් හඳුනාගෙන ඔවුන්ට විභාගයට පෙනී සිටීමේ දී අවශ්‍ය සහන ලබා දෙන ලදී.

- ඇගයීම් වාර්තා සියලු පාසල්වලට ලබාදීම හා වෙබ් අඩවියට ඇතුළත් කිරීම මගින් දුෂ්කර ප්‍රදේශවල සිට විභාගයට ඉදිරිපත් වන සිසුන්ට ද විභාගය පිළිබඳ තොරතුරු හා උපදෙස් සන්නිවේදනය කිරීම, ගුරුවරුන්ට නිසි උපදෙස් ඒ හරහා ලබාදීම හා අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ කටයුතු කරන නිලධාරීන්ට සිසුන්ගේ දුර්වලතා පිළිබඳ තක්සේරුවක් ලබාදීම.

- එක් එක් ජාතික විභාග ආසන්නයේ දී විභාග අපේක්ෂකයන්, ගුරුවරුන්, දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍ය භාවිතයෙන් පැවැත්වෙන දැනුවත් කිරීමේ සාකච්ඡා.

අභියෝග

- අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් වීම සඳහා ශාස්ත්‍රපති (Masters (MA/MEd)) උපාධියක් ලබා ගැනීම අවශ්‍ය වේ. එම සුදුසුකම් සපුරාලීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තක්සේරුකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ නොවන විෂය ක්ෂේත්‍රයන් හදාරා සුදුසුකම් සම්පූර්ණ කර ගනී. නමුත් මෙම දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරියෙකු වශයෙන් තක්සේරුකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ සුවිශේෂී වෘත්තීය දැනුම නොමැතිකම දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක සපුරා ගැනීම සඳහා පවතින අභියෝගයක් වේ. ඒ අනුව මෙම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා තක්සේරුකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ Masters උපාධියක් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දීම තීරණාත්මක කාලීන අවශ්‍යතාවයකි.

- විභාගය මූලික කරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හේතුවෙන් ඉගෙනුම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලිය පන්තිකාමර තුළ සිදු නොවීම තුළ නිපුණතා රහිත සිසුන් පාසලෙන් පිටවීම අභියෝගයක් වී ඇත.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	90	75	15
තෘතීයික	26	14	12
ද්විතියික	489	316	173
ප්‍රාථමික	209	ස්ථිර - 191 අනියම් - 10	08

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහනා කරන්න.

උක්ත 6.1 හි සඳහන් පරිදි මානව සම්පත් හිඟයක් පැවතියද, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බලපෑමක් නොවන අයුරින් දැනට පවතින මානව සම්පත දෙපාර්තමේන්තු රාජකාරි සඳහා යොදවා ගැනීමට දෙපාර්තමේන්තු පරිපාලනය සමත් ව ඇත. එමෙන්ම, දැනට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම තුලින් පවත්නා තත්ත්වයට වඩා උසස් වූ කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කිරීමට හැකි වනු ඇති බවට විශ්වාස කෙරේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Using Microsoft Excel in your Workplace	10	දින 02	120	-	දේශීය	දෙපාර්තමේනතුවේ විවිධ ශාඛාවන්හි පවතින කාර්යභාරයන්ට අදාළව දත්ත විශ්ලේෂණය, ගණනය කිරීම වැනි කටයුතු පවතින බැවින් එම කාර්යයන් පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා නිසි පුහුණුව
Essentials in Systems & Network Administration	06	දින 05	150	-	දේශීය	පරිගණක පද්ධතියක හා ජාලගතකරණයේ වැදගත්කම හඳුනාගනිමින් කාර්යාලීය ජලකරණ පද්ධතිය හා ඒ ආශ්‍රිත සේවාවන් සිදු කිරීම සඳහා නිසි පුහුණුව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා හා සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි යන විෂය පථයන් සම්බන්ධ පුහුණු වැඩමුළුව	55	දින 02	35	-	දේශීය	කාර්යාලීය කටයුතු සිදු කිරීමේදී නිලධාරීන් සඳහා අවශ්‍ය වන කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි යන විෂයයන් පිළිබඳ නිසි අවබෝධය හා දැනුම
Telephone skill & Etiquette Training for Secretaries & Front Office Staff	02	දින 02	14	-	දේශීය	නිරන්තරයෙන් දුරකථනය මගින් මහජනතාව සමඟ සන්නිවේදන කටයුතුවල නිරත වන නිලධාරීන් සඳහා දුරකතන කුසලතා හා ආචාර ධර්ම පිළිබඳ නිසි පුහුණුව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Government Payroll System	02	දින 03	36	-	දේශීය	Payroll System මෘදුකාංගය ආශ්‍රයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳව නිසි අවබෝධය හා පුහුණුව
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	57	දින 02	60	-	දේශීය	දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ වැදගත්කම හා එය නිවැරදිව සකස් කිරීම පිළිබඳව නිසි අවබෝධය හා පුහුණුව
Mastering Microsoft Excel – Certificate Course in Basic to Advance Excel	17	මාස 03	331.5	-	දේශීය	Microsoft Excel ආශ්‍රිත සමීකරණ හා ශ්‍රිත භාවිතයෙන් දත්ත විශ්ලේෂණය, ගණනය කිරීම් ඇතුළු කාර්යාලීය කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පැවරීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	සෑම වාර්තාවකටම මාසයක් තුළ පිළිතුරු ලැබී නොමැත	සෑම වාර්තාවකටම වාර්තාව ලැබුණ දින සිට දින 14 ක් තුළ පිළිතුරු සැපයීම කළ යුතු බව දන්වා යවා ඇත
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	නිහඬිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නිහඬිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ 600 කට ආසන්න නිලධාරීන් සංඛ්‍යාවක් සේවය කරනු ලබන අතර, වර්ෂය පුරාම ජාතික මට්ටමේ හා ආයතනික විභාග විශාල ප්‍රමාණයක් පැවැත්වීම සඳහා තම දායකත්වය ලබා දෙයි. වර්ෂය පුරාම අධික ලෙස කාර්යබහුල මෙම සියලුම නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව සිදු කිරීම දුෂ්කර වන අතර, අවශ්‍යතාව අනුව අදාළ කණ්ඩායම් සඳහා පුහුණුව ලබාදීමට කටයුතු කරනු ලැබේ. එසේම වර්ෂයක් තුළ කාර්යමණ්ඩල පුහුණු සඳහා වෙන් වන ප්‍රතිපාදන සීමිත බැවින් සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ නොහැකි වේ. එසේම 2021 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම හා එම ගිවිසුම් අනුව නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ නොහැකි විය.	සුවිශේෂී කාර්යභාරයක නිරත වන විභාග දෙපාර්තමේන්තුවේ විශේෂිත කාර්යභාරයන්වල නියැලී සිටින නිලධාරීන් 600 කට ආසන්න ප්‍රමාණයකට ගිවිසුම් අත්සන් කොට ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව සිදු කළ හැකි කාර්යයක් නොවේ.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		